ඊශ්‍රායල් රාජ්‍යයේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය අතර ඊශ්‍රායල් රජයේ නිශ්චිත ශ්‍රම වෙළඳපොළ අංශවල ශ්‍රී ලාංකික සේවකයන් තාවකාලිකව රැකියා නියුක්තියේ යෙදවීම පිළිබඳ ගිවිසුම

අගතියෙන් තොරයි

පූර්විකාව

ඊශ්‍රායල් රාජ්‍යයේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික **සමාජවාදී ජනරජයේ රජය** (මෙහි මින් මතු සාමූහිකව **"පාර්ශවයන්"** ලෙස සහ එකළාව **"පාර්ශවය"** ලෙස සඳහන් කරනු ලබන) දෙරට අතර මිත්‍රශීලීත්වය සහ සහයෝගීතාව ඉහළ නැංවීමට කැමැත්තෙන් පසුවන හෙයින් ද:

ඊශ්‍රායලයේ විදේශ සේවකයන් බඳවා ගැනීම සහ තාවකාලික රැකියා නියුක්තියේ යෙදවීම ඊශ්‍රායලයේ බල පවත්වන නීතිය, ඊශ්‍රායල ජාතික ශ්‍රම වෙළඳපොළවල තත්ත්වය සහ විදේශ සේවක රැකියා නියුක්තිය සඳහා විවෘත අංශ සම්බන්ධයෙන් ඊශ්‍රායල රාජ්‍යයේ රජයේ ප්‍රතිපත්තිය මෙන්ම තාවකාලික විදේශ සේවකයන් සඳහා වාර්ෂික කෝටාවන් සහ එක් එක් අංශය සඳහා රැකියා බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන පූර්ව කොන්දේසි ප්‍රකාරව සිදු කරනු ලබන හෙයින් ද;

මිනිස් ජාවාරම, නීති විරෝධී සංක්‍රමණය, අලේඛනගත සහ නීති විරෝධී මිනිස්බල බඳවාගැනීම් පරිචයන් සහ විදේශ සේවකයන් නීති විරෝධීව රැකියාවන්හි නියුක්ත කරවීම මරධනය කිරීමේ තම පොදු අරමුණ පාර්ශවයන් මෙමගින් ප්‍රකාශ කරන හෙයින් ද;

බඳවා ගැනීමේ සහ සේවයේ නියුක්ත කරවීමේ ක්‍රියාදාමය පුරාම නීති විරෝධී බඳවාගැනීම් ගාස්තු අයකිරීම සහ ගෙවීම තුරන් කිරීම පිණිස වන සිය අන්‍යොන්‍ය කැමැත්ත පාර්ශවයන් බෙදා හදා ගන්නා හෙයින් ද සහ මෙම අරමුණ සාක්ෂාත කර ගැනීම පිණිස සහයෝගයෙන් කටයුතු කිරීමට පාර්ශවයන් සිය කැමැත්ත ප්‍රකාශ කර ඇති හෙයින් ද;

ඊශ්‍රායලයේ නිශ්චිත අංශවල තාවකාලික රැකියා නියුක්තිය සඳහා පැමිණෙන ශ්‍රී ලාංකික සේවකයන් නීත්‍යානුකූල, සාධාරණ සහ දැනුවත් ආකාරයෙන් සහ මෙම ගිවිසුමෙහි ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛනයන්හි (මෙහි මින්මතු **"ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛන"** ලෙස සඳහන් කරනු

ලබන) දක්වා ඇති පටිපාටි ප්‍රකාරව බඳවාගැනීම සහ තාවකාලික රඳවා ගැනීම මෙන්ම ඔවුන් ඊශ්‍රායලයේ නීත්‍යානුකූලව රැඳී සිටින කාලය අවසානයේදී ඔවුන්ගේ රට වෙත ආපසු යැවීම සහතික කිරීම සඳහා පාර්ශවයන් අපේක්ෂා කරන හෙයින් ද;

පාර්ශවයන් පහත දැක්වෙන පරිදි එකඟතාවට එළඹේ.

අගතියෙන් තොරයි

<u>වගන්තිය 1- පොදු</u>

1. **"තාවකාලික රැකියා නියුක්තිය"** යන යෙදුමෙන් අදහස් වනුයේ, ඊශ්‍රායල ජාතික නීතිය, රෙගුලාසි, රීති සහ සීමිත කාලසීමාවක් සඳහා වන ඊශ්‍රායල රාජ්‍යයේ රජයේ පටිපාටි සහ යෝජනාවන්ට අනුකූලව විදේශීය සේවයකයකු සේවයේ නියුක්ත කරවීම පිණිස ඊශ්‍රායල රාජ්‍යයේ රජය විසින් නිකුත් කරනු ලැබ ඇති වලංගු බලපත්‍රයක් දරන සේවා යෝජකයකු විසින්, ශ්‍රී ලංකාවේ වැසියකු නීත්‍යානුකූලව සේවයේ නියුක්ත කරවීම වන අතර ඊට පසුව ශ්‍රී ලාංකික ජාතිකයා ඊශ්‍රයලයෙන් පිටවිය යුත්තේය.

2. අවසර දී ඇති එක් එක් අංශයේ තාවකාලික රැකියා නියුක්තියේ කාලසීමාව, අදාළ ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු අතර ඊශ්‍රායලයේ අදාළ ජාතික නීතියේ මෙන්ම එක් එක් අංශයෙහි තාවකාලික විදේශීය සේවකයන් සඳහා වාර්ෂික කෝටාවන් සම්බන්ධයෙන් ඊශ්‍රායල රාජ්‍යයේ රජයේ අදාළ යෝජනා සම්මතයන්හි දක්වා ඇති පරිදි අවසර දී ඇති උපරිම කාල සීමාව නොඉක්මවිය යුත්තේය.

3. එක් එක් නිශ්චිත අංශය සඳහා වන සිය ජාතික නීති සහ පටිපාටි ප්‍රකාරව මෙම ගිවිසුම යටතේ තාවකාලික රැකියා නියුක්තිය පිණිස බඳවාගත් ශ්‍රී ලාංකික සේවකයන් සඳහා වීසා සහ රැකියා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඊශ්‍රායල රාජ්‍යයේ රජය පහසුකම් සැපයිය යුත්තේය.

4. එක් එක් අනුමත අංශයෙහි, මෙම ගිවිසුම යටතේ තාවකාලික කාල සීමාවක් සඳහා සේවයේ නියුක්ත කරවිය හැකි ශ්‍රී ලාංකික සේවකයන්ගේ උපරිම සංඛ්‍යාව එම නිශ්චිත අංශය සඳහා ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයක දැක්විය යුතු අතර ඊශ්‍රායල රජයේ යෝජනා සම්මතයන්හි නිශ්චිතව දක්වා ඇති තාවකාලික විදේශ සේවකයන් සඳහා කෝටාවන්ට මෙන්ම ඊශ්‍රායලයේ සේවා යෝජකයන්ගෙන් ලැබෙන රැකියා අවස්ථා සංඛ්‍යාවට යටත් වන්නේය. මෙම ගිවිසුමෙහි හෝ ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයේ සඳහන් කිසිවක් හෝ ශ්‍රී ලංකාවෙන් සේවකයන් බඳවා ගැනීම හෝ සේවකයන් බඳවා ගැනීම ශ්‍රී ලංකාවට පමණක් සීමාකිරීම සඳහා ඊශ්‍රායලයේ බැඳීමක් සේ නොසැලකිය යුත්තේය.

5. අදාළ ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයේ දක්වා ඇති පරිදි තාවකාලිකව රැකියාවන්හි නියුක්ත කර ඇති සේවකයන් හට වැටුප් ලබන වෙනත් කවර හෝ ශ්‍රම ක්‍රියාකාරකමක නිරත වීමට හෝ තමන්ට වීසා සහ රැකියා බලපත්‍ර අංශය නිකුත් කරනු ලැබ ඇති අංශය හැර වෙනත් කිසිදු අංශයක සේවය කිරීමට හිමිකමක් නොමැත්තේය.

6. අදාළ සිය නීති සහ රෙගුලාසි ප්‍රකාරව තාවකාලික ශ්‍රී ලාංකික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස අවශ්‍ය සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමට එක් එක් පාර්ශවය කටයුතු කළ යුත්තේය.

අගතියෙන් තොරයි

<u>වගන්තිය 2- අරමුණු</u>

මෙම ගිවිසුමේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

අ. ඊශ්‍රායලයේ තාවකාලික රැකියා සඳහා පැමිණෙන ශ්‍රී ලාංකික ජාතිකයන් සඳහා මෙම ගිවිසුමේ දක්වා ඇති මූලධර්ම ප්‍රකාරව නීත්‍යානුකූල, සාධාරණ සහ දැනුවත් බඳවා ගැනීම් ක්‍රියාදාමයක් සහතික කිරීම සහ එවැනි රැකියා බඳවාගැනීම් සම්බන්ධයෙන් නීති විරෝධී ගාස්තු ලබා ගැනීම වැළැක්වීම.

ආ. තාවකාලික විදේශීය ශ්‍රම ගැටලු සම්බන්ධයෙන් පාර්ශවයන් අතර අදාළ තොරතුරු හුවමාරුව සහ අඛණ්ඩ සහයෝගීතාව සඳහා රාමුවක් ස්ථාපිත කිරීම.

ඇ. ශ්‍රී ලාංකික සේවකයන් බඳවාගැනීම, තෝරා ගැනීම, ස්ථාපනය, පැමිණීම සහ රැකියා නියුක්තිය මෙන්ම ඊශ්‍රායලයේ ඔවුන්ගේ තාවකාලික රැකියා නියුක්තියෙන් පසුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණීම සම්බන්ධයෙන් පාර්ශවයන් අතර සහයෝගීතාව සහතික කිරීම.

ඈ. මෙම ගිවිසුම යටතේ බඳවාගනු ලබන ශ්‍රී ලාංකික සේවකයන් හට □දාළ □ංශයේ රැකියා නියුක්තිය සඳහා □වශ්‍ය සුදුසුකම් තිබෙන බව, ඊශ්‍රායලයේ නීත්‍යානුකූලව නැවැතී සිටින කාලය සඳහා නියම සහ කොන්දේසි ඔවුන් □වබෝධ කරගන්නා බව සහ ඊශ්‍රායලයේ තම නීත්‍යානුකූල රැකියා නියුක්ති කාලසීමාව □වසානයේදී තම රට වෙත ආපසු යාම සඳහහා වන සිය බැඳීම සහතික කිරීම.

ඉ. බඳවාගැනීමේ, තෝරා ගැනීමේ, ස්ථාපනය කිරීමේ, පැමිණීමේ, රැකියා නියුක්තියේ සහ ආපසු යාමේ ක්‍රියාවලිය පුරාම ඊශ්‍රායලයේ තාවකාලික රැකියාවන්හි නිරත ශ්‍රී ලාංකික සේවකයන්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීම.

අගතියෙන් තොරයි

වගන්තිය 3- සහයෝගීතා අධිකාරි

එකඟතාවන්ට එළඹී විවිධ අංශයන්හි මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස පාර්ශවයන් විසින් අදාළ රජයේ අමාත්‍යාංශ හෝ නියෝජිතායතන නම්කර බලය පැවැරිය යුත්තේය (මෙහි මින් මතු **"සහයෝගීතා අධිකාරී"** ලෙස සඳහන් කරනු ලබන) . එලෙස ක්‍රියාත්මක කිරීමේදී ඊශ්‍රායල සහයෝගීතා අධිකාරියට ශක්නුවත් නිල ඊශ්‍රායල ආයතනයක් හෝ එය විසින් හෝ එය වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙනත් ආයතනයක් විසින් සහාය ලබා දෙනු ඇත. එක් එක් නිශ්චිත අංශය සඳහා වන අදාළ සහයෝගීතා අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛනයක ස්ථාපිත කරනු ලැබිය යුත්තේය නැතහොත් තානාපති මාර්ග ඔස්සේ නිල ලිඛිත ආකාරයෙන් පාර්ශවයන් විසින් තහවරු කරනු ලැබිය යුත්තේය.

වගන්තිය 4- ක්‍රියාත්මක කිරීමේ පොදු විධිවිධාන

1. එක් එක් නිශ්චිත අංශයේ ඊශ්‍රායලයේ තාවකාලික රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් බඳවාගැනීම, එක් එක් අංශය සඳහා වන ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛන සහ ඒවායේ පරිශිෂ්ටයන්හි දක්වා ඇති පරිදි ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට පාර්ශවයන් එකඟ වන්නේය.

2. රාජ්‍ය තාන්ත්‍රික අංශ ඔස්සේ තහවුරු කරන ලද ලිඛිත සැකසුමක දක්වා ඇති සහයෝගීතා අධිකාරි ආයතනවල අනොන්‍ය එකඟතාව මගින් සමාපනීය ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛ ඉටුකරනු ලැබිය යුත්තේය.

3. මෙම ගිවිසුම සහ එය යටතේ කිසියම් ක්‍රියාකාරකමක් ක්‍රියාවට නැංවීම එක් එක් රාජ්‍ය පාර්ශවයේ අදාළ කර ගත යුතු නීති, රෙගුලාසි, රීති, පරිපාටි සහ යාන්ත්‍රණ ප්‍රකාරව විය යුත්තේය.

වගන්තිය 5- සාමාන්‍ය සේවක සුදුසුකම්

මෙම ගිවිසුම යටතේ තාවකාලික රැකියා නියුක්තිය සඳහා බඳවාගනු ලබන ශ්‍රී ලාංකික සේවකයන් සතුව,අදාළ අංශය සඳහා අවශ්‍ය කරනු ලබන පරිදි, අවශ්‍ය සියලු කුසලතා, පුහුණුව සහ අත්දැකීම් තිබෙන බවත්, ඔවුන් වෛද්‍ය පරීක්ෂණයනට ලක් කර ඇති බවත්, මනා ශාරීරික සහ මානසික

සෞඛ්‍යයකින් සිටින බවත්, අදාළ වෛද්‍ය සහතික සතු බවත්, අපරාධ වාර්තා නොමැති බවත් යන සියල්ල අදාළ ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛෆය් නිශ්චිතව දක්වා ඇති පරිදි සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය තමන් වෙනුවෙන් අදාළ සහයෝගිතා අධිකාරියට උපදෙස් දිය යුත්තේය.

අගතියෙන් තොරයි

වගන්තිය 6- බදවාගැනීමේ ක්‍රියාදාමය

බඳවාගැනීමේ ක්‍රියාදාමය පාරදෘශ්‍ය බවත්, සියලු අදාළ තොරතුරු අයදුම්කරුවන්ට සපයනු ලබන බවත්, (ඊශ්‍රායලයේ නීත්‍යානුකූලව රැඳී සිටීම සහ රැකියා නියුක්තිය සහ ඊශ්‍රායලයේ සිය නීත්‍යානුකූල රැකියා නියුක්ති කාලසීමාව අවසානයේ ශ්‍රී ලංකාව කරා ආපසු යාම සම්බන්ධයෙන් වන සිය බැඳීම් ඇතුළුව) සමස්ත බඳවාගැනීමේ ක්‍රියාදාමය පුරාම හෝ ඊශ්‍රායලයේ සිය රැකියාව කරන අතර තුර, ඊශ්‍රායලයේ ජාතික නීතිවල දක්වා ඇති අවසර දී ඇති ගෙවීම් ඉක්මවිය නොයුතු අදාළ ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයේ දක්වා ඇති අවසරලත් යම් ගෙවීමක් හැර කිසිදු ගාස්තුවක් හෝ ගෙවීමක් අයදුම්කරුවන්ගෙන් හෝ සේවකයන්ගෙන්, සෘජුව හෝ වක්‍රව, රටවල් දෙකින් කවරකදී හෝ අයකරගනු නොලබන බවත් සහතික කිරීම පිණිස සියලු ක්‍රියාමාර්ගයන් ගැනීමට පාර්ශවයන් එකඟ වන්නේය.

වගන්තිය 7- ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව සහ තොරතුරු හුවමාරුව

1. තම අදාළ සහයෝගිතා අධිකාරි හරහා පාර්ශවයන්, කම්කරු සබඳතා නියාමනය කරන්නා වූ වත්මන් නීති හා පටිපාටි හා යාවත්කාලීන කිරීම් මෙන්ම මෙම ගිවිසුමේ දක්වා ඇති පටිපාටි කෙරෙහි බලපෑමට ඉඩ ඇති රට වෙත ඇතුළුවීම, රැඳී සිටීම, වැටුප් සහිත රැකියා නියුක්තිය, සේවා යෝජකයයන්ගේ බැඳීම් සහ විදේශ සේවකයන්ගේ පිටත්වීම සම්බන්ධයෙන් අදාළ තොරතුරු හුවමාරු කරගත යුත්තේය.

2. මෙම ගිවිසුමේ ක්‍රියාත්මක කිරීමෙන් පැන නගින ගැටලු විසඳීමේ කාර්යය සඳහා පාර්ශවයන්ගේ නියෝජිතයන්ගෙන් සැදුම් ලත් ඒකාබද්ධ

සම්බන්ධීකරණ කමිටුවක් (මෙහි මින් මතු "ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව" ලෙස හඳුන්වනු ලබන) ස්ථාපිත කළ යුත්තේය.

3. පාර්ශව දෙක්න කවරක් හෝ ඉල්ලීමක් කරනු ලැබුවහොත්, අනොන්‍ය වශයෙන් ඒකඟ වූ කොන්දේසි සහ දිනයන් ප්‍රකාරව හෝ විඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් වැනි වෙනත් කවර හෝ තාක්ෂණික ක්‍රමවේද හරහා ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව, එක් එක රටෙහි මාරුවෙන් මාරුවට වාර්ෂික පදනමින් රැස්විය යුත්තේය. තමන් සාකච්ඡා කිරීමට අදහස් කරන කරුණු, එක් එක් රැස්වීම් දිනට දින තිහකට (30) නොඅඩු කාලයක් තුළ, පාර්ශවයන් එකිනෙකාට ලිඛිතව දැනුම් දිය යුත්තේය.

4. එක් එක් රැස්වීමෙන් අනතුරුව, එකඟ වූ කාර්ය සටහන් කෙටුම්පත් කළ යුත්තේය.

5. පාර්ශව දෙකින් කවරක් හෝ සිදුකරනු ලබන ඉල්ලීමක් මත, සාකච්ඡා කළ යුතු හදිසි කරුණු ඇති අවස්ථාවකදී, ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුවේ අතිරේක විශේෂ රැස්වීම් කැඳවිය හැක්කේය.

අගතියෙන් තොරයි

<u>වගන්තිය 8- පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම</u>

මෙම ගිවිසුම සහ එහි ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛන යටතේ සම්ප්‍රේශනය කළ, හඳුනාගනු ලැබූ හෝ හඳුනාගත හැකි ස්වභාවික පුද්ගලයකු හා සම්බන්ධ තොරතුරු සම්ප්‍රේශනය කිරීම, තබා ගැනීම සහ සැකසුම එක් එක් පාර්ශවයෙහි, පුද්ගලිකත්වය සහ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම අරබයා වන අදාළ දේශීය නීතියට යටත් විය යුත්තේය. එවැනි තොරතුරු රහස්‍ය විය යුතු අතර භාවිතා කළ යුත්තේ හුදෙක්ම මෙම ගිවිසුම සහ එහි ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛවල කාර්යය සඳහා පමණි.

<u>වගන්තිය 9- නෛතික සහයෝගීතාව</u>

එක් එක් රාජ්‍ය පාර්ශවයේ නීතියට යටත්ව මෙම ගිවිසුමේ දක්වා ඇති කරුණුවලට අදාළ විමර්ශන සහ නඩු පැවැරීම්වලදී පාර්ශවයන් සහයෝගයෙන් කටයුතු කර අවශ්‍ය සහාය දැක්විය යුත්තේය.

වගන්තිය 10 - සේවකයන් ආපසු පැමිණීම

1. රැකියා නියුක්තිය සඳහා අවසරලත් රැඳී සිටීමේ කාලය ඉකුත් වූ වහාම සේවකයා ඊශ්‍රායලයෙන් පිටත්විය යුත්තේය.

2. ඊශ්‍රායලය බලා පිටත්වීමට පෙර, ශ්‍රී ලාංකික සේවකයන් තමන්ට තේරුම් ගත හැකි භාෂාවකින් ප්‍රකාශයක් අත්සන් තැබිය යුතු අතර එමගින් ඔවුන් ඊශ්‍රායලයේ නීත්‍යානුකූල රැකියා නියුක්තිය සහ රැඳී සිටීම සඳහා කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට, ඊශ්‍රායලයේ තම නීත්‍යානුකූල රැකියා නියුක්ත කාලසීමාව අවසානවීමේදී ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමට මෙන්ම වෙනත් කවර හෝ පටිපාටියක් සපුරාලීමට හෝ මෙම වගන්තිය සමඟ අනුකූලතාවය සහතික කරනු වස් අතිරේක ප්‍රකාශ අත්සන් තැබීමට හෝ සහයෝගිතා බලධාරීන් විසින් එකඟතාවට එළඹී පරිදි වෙනත් කිසියම් ඇපවීමක් සැපයීමට ප්‍රතිඥා දිය යුත්තේය.

3. අනෙකුත් කරුණු අතර තමන්ට අවසර දී ඇති රැඳී සිටීමේ කාලය අවසානයේදී සේවකයකු ඊශ්‍රායලයෙන් පිටත්ව නොයාම, සේවකයකු තම වීසා බලපත්‍රයේ, රැකියා බලපත්‍රයේ හෝ මෙම වගන්තියේ 2වන ඡේදය ප්‍රකාරව ඔහු විසින් අත්සන් තබනු ලැබූ ප්‍රකාශයේ කොන්දේසි කඩකිරීම හෝ මෙම ගිවිසුම කඩකිරීම යන අවස්ථාවන් ඇතුළුව හෝ ඔහුගේ රැඳී සිටීම ජාතික ආරක්ෂාවට, මහජන සාමයට හෝ මහජන සෞඛ්‍යයට තර්ජනයක් වේ යැයි ඊශ්‍රායල් රාජ්‍යයේ රජය නිශ්චය කරන්නේ නම් ඊශ්‍රායල නීති, රෙගුලාසි, රීති, පටිපාටි සහ ඊශ්‍රායල් රාජ්‍යයේ රජයේ යෝජනා සම්මත ප්‍රකාරව හෝ ශ්‍රී ලාංකික ජාතිකයකුට එරටින් පිටවීමට නියෝග කිරීමට ඇති අයිතිය ඊශ්‍රායල් රාජ්‍යයේ රජය සතු වන්නේය.

අගතියෙන් තොරයි

4. මෙම ගිවිසුම යටතේ බඳවාගත් ශ්‍රී ලාංකික සේවකයන්ට ඊශ්‍රායලයේ සිය නීත්‍යානුකූල රැකියා නියුක්තිය අවසානයේදී ශ්‍රී ලංකාවට කඩිනමින් සහ

සඵලව ආපසු පැමිණීම සඳහා ඉඩ ලබා දීමට පාර්ශවයන් අවශ්‍ය පරිදි සහයෝගිතාව දැක්විය යුත්තේය. මෙම ගිවිසුම යටතේ බඳවාගත්, ඊශ්‍රායලයේ නීති විරෝධීව රැඳී සිටින ශ්‍රී ලාංකික සේවකයන්ට කඩිනමින් සහ සඵලව ආපසු පැමිණීම සඳහා ද ඔවුන් සහයෝගයයෙන් කටයුතු කළ යුත්තේය.

වගන්තිය 11 - ආරවුල් නිරාකරණය -පොදු

මෙම ගිවිසුමේ වලංගුභාවය, කඩකිරීම හෝ අවසන් කිරීම ඇතුළුව මෙම ගිවිසුමෙන් හෝ ඊට අදාළව මතුවන කිසියම් ආරවුලක්, අර්බුදයක් හෝ හිමිකම් පෑමක් පාර්ශවයන් අතර සාකච්ඡා මගින් සුහදව විසඳා ගත යුත්තේය.

වගන්තිය 12 - සේවා යෝජකයන් සහ සේවකයන් අතර ආරවුල් නිරාකරණය

සේවා යෝජකයන් සහ සේවකයන් අතර මතුවිය හැකි ඕනෑම ආරාවුලක් ඊශ්‍රායල් රාජ්‍යයේ අධිකරණයේ අනන්‍ය අධිකරණ බලයට යටත් විය යුතු අතර එහි නීති රීති තෝරාගැනීම පිළිබඳ සැලකිල්ලක් නොමැතිව හුදෙක්ම අදාළ කර ගත යුතු ඊශ්‍රායල නීතිය ප්‍රකාරව නිරාකරණය කළ යුත්තේය.

වගන්තිය 13 - මෙම ගිවිසුම බලාත්මක වීම, එහි කාලසීමාව සහ අවසන් කිරීම

1. මෙම ගිවිසුම බලාත්මක වීම සඳහා අවශ්‍ය කරනු ලබන තම අභ්‍යන්තර නෛතික පටිපාටි සම්පූර්ණ කිරීම පිළිබඳ පාර්ශවයන් එකිනෙකාට දැනුම් දෙන රාජ්‍ය තාන්ත්‍රික සටහන්වල අපරෝක්ත දිනයෙහි මෙම ගිවිසුම බලාත්මක වන්නේය.

2. ඉහත කුමක් සඳහන් වුවද, යම් නිශ්චිත අංශයක් සඳහා මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම, එම අංශය සඳහා උචිත ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයක් අදාළ සහයෝගීතා අධිකාරී අත්සන් තැබීමෙන් පසුව ආරම්භ විය යුත්තේය.

3. අනොන්‍ය සහමතියෙන්, පාර්ශවයන් ලිඛිතව මෙම ගිවිසුම සංශෝධනය කළ හැක්කේය. එවැනි සංශෝධන, මෙම වගන්තියේ (1) වැනි ඡේදයේ දක්වා ඇති පටිපාටි ප්‍රකාරව බලාත්මක විය යුත්තේය. ක්‍රියාත්මක කිරීමේ මූල ලේඛයකට සිදුකරන කිසියම් වෙනස් කිරීමක් ක්‍රියාත්මක කිරීමේ මුල ලේඛයේ දක්වා ඇති පටිපාටිය ප්‍රකාරව බලාත්මක විය යුතුය.

අගතියෙන් තොරයි

4. මෙම ගිවිසුම වසර තුනක (3) කාල සීමාවකින් අවසන් කළ යුතු අතර එක් (1) වසරක කාල සීමාවන් සඳහා නිරායාසයෙන් දීර්ඝ කරනු ලැබිය යුත්තේය.

5. ඉල්ලා සිටිනු ලබන අවසන් කිරීමේ දිනයට යටත් පිරිසෙයින් මාස හයකට (6) පෙරාතුව අනක් පාර්ශවයට රාජ්‍යතාන්ත්‍රික සටහනක් යැවීම මගින් පාර්ශව දෙකෙන් කවරකට හෝ මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවක අවසන් කළ හැක්කේය.

6. බඳවා ගැනීමේ ක්‍රියාදාමය සහ රකියා නියුක්තිය මුළුල්ලෙහිම ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් හෝ සේවකයන්ගෙන් නීති විරෝධී ගාස්තු අයකිරීම හෝ ගෙවීම සම්බන්ධයෙන් පාර්ශව දෙකෙන් කවරක් හෝ යම් ප්‍රශ්නයක් මතු කිරීමේදී සහ ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව ඒ පිළිබඳව අනොන්‍යව පිළිගත හැකි විසඳුමක් ඉදිරිපත් කිරීමට අසමත් වන විටදී හෝ ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටුව කැඳවන ලෙස පාර්ශව දෙකෙන් කවරක් හෝ ඉල්ලීමක් සිදු කළ දිනයේ සිට දින හතළිස් පහක් (45) ඇතුළත (යොදා ගත හැකි යම් විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ ඇතුළුව) කැඳවනු නොලබන්නේ නම්, පාර්ශව දෙකෙන් කවරක් හෝ අදාළ ක්‍රියාත්මක කිරීමේ මූලලේඛය යටතේ ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් සියල්ල හෝ කොටසක් පාර්ශව දෙකෙන් කවරක් හෝ වහාම අත්හිටුවිය හැක්කේය.

7. මෙම ගිවිසුමේ 13 (5) වගන්තිය හෝ 13(6) වගන්තිය යටතේ ගනු ලබන තීරණ, මෙම ගිවිසුමේ රාමුව තුළ ඊශ්‍රායලයේ නීත්‍යානුකූලව රැකියාවේ නියුක්ත කර ඇති ශ්‍රී ලාංකික සේවකයන් ඇතුළුව, එවැනි තීරණයක දිනය වන විටත් මෙම ගිවිසුම යටතේ වීසා බලපත්‍රයක් දරණ කවර හෝ තැනත්තෙකුට බල නොපෑ යුත්තේය.

ඊට සාක්ෂි පිණිස, නිසි පරිදි බලය පවරා ඇති පහත අත්සන් තබා ඇති අය, මෙම ගිවිසුමට අත්සන් තබා තිබේ.

2020 ..අගෝ.. මස ..24.. දිනට අනුරූපී යුදෙව් දින දර්ශනයෙහි 5780 ..සෙප්තැ.. මස ..... දින ..27.. දී මුල් පිටපත් දෙකකින් යුතුව සිංහල, යුදෙව් සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අත්සන් තබන ලදී. අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අපසරණයක් වෙතොත්, එවිට ඉංග්‍රීසි පාඨය බල පැවැත්විය යුත්තේය.

ඊශ්‍රායල් රාජ්‍යයේ රජය වෙනුවෙන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය වෙනුවෙන්